සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

87 S I

10 ශ්‍රේණිය

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

i. **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.**

ii. **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

iii. **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

---

01. සන්නිවේදකයා විසින් තෝරාගත් මාධ්‍යයක් ඔස්සේ යවනු ලබන සන්දේශය අත්පත් කරගනු ලබන්නේ,
(1) සන්නිවේදකයා ය. (2) මාධ්‍යවේදියා ය. (3) සංස්කාරකවරයා ය. (4) ග්‍රාහකයා ය.

02. අන්තර්පුද්ගල සන්නිවේදනයේ විශේෂතාවක් වන්නේ,
(1) ඒක පාර්ශවික සන්නිවේදනයක් සිදු වීමයි. (2) ප්‍රතිපෝෂණය ප්‍රමාද වීමයි.
(3) අන්තර් ක්‍රියාකාරී සන්නිවේදනයක් සිදුවීමයි. (4) සිතුවිලි හැඟීම් මත සන්නිවේදනය සිදුවීමයි.

03. ගුවන්විදුලි නාලිකාවක් ශ්‍රවණය කරමින් සිටි අමල්ට හදිසියේ ම හටගත් වර්ෂාව නිසා හඬ නොඇසුණි. මෙය කුමන සන්නිවේදන බාධකයක් ද?
(1) අර්ථ බාධකයකි. (2) මාධ්‍ය බාධකයකි.
(3) ඒකාබද්ධ බාධකයකි. (4) මානසික බාධකයකි.

04. ශ්‍රී ලාංකික පාසල් තුළ විවිධ ආගමික හා ජාතික උත්සව පැවැත්වීමෙන් අපේක්ෂිත අරමුණක් වන්නේ මින් කුමක් ද?
(1) තොරතුරු සම්පාදනය. (2) අධ්‍යාපනය ලබා දීම.
(3) ඒකාබද්ධතාව. (4) සමාජානුයෝජනය.

05. සංජානනය යනු,
(1) වැරදි ලෙස තොරතුරු ගොනු කර සන්දේශය සැකසීමයි.
(2) පංචේන්ද්‍රියන් මගින් සංදේශය ග්‍රහණය කරගෙන තේරුම් ගැනීමයි.
(3) සංස්කෘතික උරුමයන් පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යාමයි.
(4) ශ්‍රාවකයා වෙත ගලායන සන්දේශය පාලනය කිරීමයි.

06. කැමරාවක අනිවාර්යෙන් ම පිහිටන කැමරා කොටස් දෙකක් වන්නේ,
(1) කැමරා කාචය හා ද්වාරය යි. (2) සේයා පටලය හා ද්වාරය යි.
(3) කාච විවරය හා සේයා පටලය යි. (4) කාච විවරය හා ආලෝක පටලය යි.

07. පුවත්පතක ප්‍රධාන කර්තෘගේ කාර්යයක් නොවන්නේ,
(1) අන්තර්ගතය පිළිබඳ සමස්ත වගකීම දැරීමයි. (2) සංස්කාරක වැකිය ලිවීමයි.
(3) නඩු කටයුතුවල දී නෛතික වගකීම දැරීමයි. (4) ප්‍රවෘත්ති සඳහා ශීර්ෂ පාඨ යෙදීමයි.

08. සන්නිවේදන කාර්යයට අදාළව ඇතිවිය හැකි බාධක පිළිබඳව මුලින් ම කල්පනා කළ යුතු පුද්ගලයා වන්නේ,
(1) ග්‍රාහකයා ය. (2) දොරටුපාලකයා ය.
(3) නිදහස් මාධ්‍යවේදියා ය. (4) සන්නිවේදකයා ය.

Past Papers Wiki

09. තම දැක්මට අනුව සංකල්ප ක්‍රියාත්මක වීම හා සිතුවිලි හැඟීම් මත සන්නිවේදනය සිදු කිරීම, තමා තුළ පවතින මතකය මත තීරණවලට එළඹීම යන සියලු කාරණා ඉටු වන්නේ,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනයෙනි. (2) සමූහ සන්නිවේදනයෙනි.

(3) ජන සන්නිවේදනයෙනි (4) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයෙනි.

10. ජීවන ගැටලුවලට යෝග්‍ය මෙන් ම අයෝග්‍ය තීරණ ගැනීමට ඉගැන්වීම

(1) අභිසාරී මාධ්‍ය තුළ සිදුවන්නකි.

(2) තොරතුරු සංස්කරණ කාර්යයකි.

(3) ජන සන්නිවේදනයේ සමාජ අවශ්‍යතාවයකි.

(4) ජන සන්නිවේදනය හා ජනමාධ්‍ය අතර සම්බන්ධයකි.

11. පැවැත්ම පිළිබඳ සාධක ඉදිරියට ගෙන යාම

(1) භාෂාවේ කාර්යයකි. (2) මානව සංරචකයකි.

(3) සන්නිවේදන යෝග්‍යතාවයකි. (4) කථනයේ අරමුණකි.

12. පෙර පාසල් වයසේ දරුවන් කණ්ඩායමක් රැස්කර පවත්වන දේශනයක තම පිරිසිදුකම පිළිබඳව උපදෙස් දීමේ අවස්ථාවක දී කථිකයා විසින් අසන්නන්ට සුදුසු ලෙස භාෂාව හැසිරවීම කළ යුතුය. එය

(1) භාෂාවේ ද්විරූපතාවය යි. (2) අර්ථ ගැන්වීමයි.

(3) යෝග්‍ය බවයි. (4) සවන්දීමේ පුහුණුවයි.

13. මාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව රජයේ මැදිහත්වීම් කීපයක් පහත දැක්වේ.

A බලපත්‍ර පැනවීම. B මාධ්‍ය ආයතන රජයට පවරා ගැනීම.

C මාධ්‍යවේදීන්ට විශේෂ පහසුකම් ලබාදීම. D මාධ්‍ය ආචාරධර්ම පද්ධති පැනවීම.

මෙම ප්‍රකාශ අතරින් වක්‍ර මැදිහත් වීම් වන්නේ,

(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි. (4) A හා D පමණි.

14. ගුවන්විදුලි ආයතනයක් දැන්වීම් ප්‍රචාරණයෙන් අපේක්ෂා කරන්නේ

(1) ගුවන්කාලය ගෙවා ගැනීම යි. (2) ග්‍රාහක සංඛ්‍යාව වැඩිකර ගැනීම යි.

(3) වෙළඳ අරමුණු ඉටුකර ගැනීම යි. (4) සමාජ ඒකාබද්ධතාව සුරක්ෂිත කිරීම යි.

15. අධ්‍යාපනය හා වැඩ ලෝකය අතර ඇති නොගැලපෙන හේතුව වන්නේ,

(1) අධ්‍යාපනය, නවීකරණය වන වේගයට වඩා වැඩියෙන් වැඩ ලෝකය නවීකරණය වීම යි.

(2) වැඩ ලෝකයේ නවීකරණය අධ්‍යාපන නවීකරණයට වඩා පසුගාමී වීම යි.

(3) අධ්‍යාපනයේ හා වැඩ ලෝකයේ නවීකරණය සමාන්තරව ගමන් කිරීම යි.

(4) නවීකරණයේ උපකල්පන අධ්‍යාපනය නව සම්මුතීන් හා සම්මිශ්‍රණය වී තිබීම යි.

16. පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ දී පරිගණකය මඟින් අත් පිටපත සැකසීමේ දී යොදා ගන්නේ,

(1) ඇඩොබි පේජ්මේකර් ය. (2) මයික්‍රෝසොෆ්ට් වර්ඩ් ය.

(3) මයික්‍රොසොෆ්ට් පබ්ලිෂර් ය. (4) කොරල් ඩ්‍රෝ ය.

17. තාක්ෂණික කර්මාන්තයක් වශයෙන් අති විශාල ජනතාවකට සන්දේශයක් නිර්මාණය වන්නේ,

(1) සමූහ සන්නිවේදනය තුළය. (2) අන්තවර්තී පුද්ගල සන්නිවේදනය තුළය.

(3) අන්තර් පුද්ගල සන්නිවේදනය තුළය. (4) ජන සන්නිවේදනය තුළය.

18. වර්ෂ 1832 දී ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් වූ ප්‍රථම පුවත්පත වන්නේ,

(1) කවට කතිකයා ය. (2) දිනමිණ ය. (3) කලම්බු ජර්නල් ය. (4) සිංහල බෞද්ධයා ය.

19. ජර්මන් සම්බැරීනයකින් ගලවා ගන්නා ලද විදුලි සන්දේශ උපකරණ තොගයකින් කළ අත්හදා බැලීම වන්නේ,

(1) ප්‍රතිශීර්ෂ උපකරණයක ක්‍රියාකාරීත්වය යි. (2) රූපවාහිනියේ දුරස්ථ පාලකය හැසිරවීම යි.

(3) පරිගණකයක මූසිකය ක්‍රියාකාරී වන ආකාරය යි. (4) ගුවන් විදුලි ප්‍රචාරයක් ක්‍රියාත්මක කිරීම යි.

20. සපයන තොරතුරු අනුව වාර්තාව පළවන හෝ විකාශය වන ආකාරය අනුව ගෙවීම් කරනු ලබන මාධ්‍ය වෘත්තිකයන් කණ්ඩායම වන්නේ,

(1) ප්‍රවෘත්ති සංස්කාරකවරු ය.
(2) ප්‍රාදේශීය වාර්තාකරුවන් ය.
(3) පුරවැසි මාධ්‍යවේදීන් ය.
(4) නියෝජ්‍ය කර්තෘවරුන් ය.

21. පුරවැසියකු සතු ලක්ෂණයක් නොවන්නේ,

(1) ප්‍රජාතන්ත්‍රවාදී ව ජීවත් වීම.
(2) බදු ගෙවීමට සිදු නොවීම.
(3) යහපත් ලෙස වෘත්තීයක නියැලීම
(4) ඡන්ද අයිතිය පාවිච්චි කිරීම.

22. සීමිත පහසුකම් සහිතව නොමිලේ ලබාගත හැකි විද්‍යුත් ලිපිය අද වන විට ලොව පුරා ඇති බවට සාකෂි වන්නේ,

(1) යාහූ හා ගූගල් ය.
(2) ෆේස්බුක් හා ට්විටර් ය.
(3) ලින්ක්ඩ්ඉන් හා ෆේක්බුක් ය.
(4) ෆේස්බුක් හා යාහූ ය.

23. මහජන සංවිධාන හිමි පුවත්පත් යටතේ ආගම් ප්‍රචාරය සඳහා විවිධ පුවත්පත් ප්‍රකාශයට පත් කරනු ලැබූ බවට උදාහරණ සපයන්නේ,

(1) ලංකාදීප හා වීරකේසරී ය.
(2) ලංකා ලෝකය හා සත්‍ය මාර්ගය යි.
(3) තිනක්කුරල් හා දවස පුවත්පත ය.
(4) ඥානාර්ථ ප්‍රදීපය හා සත්‍ය මාර්ගය යි.

24. මාලා තම දියණිය මාර්ගයේ ඈතින් එනු දැක අත වැනුවාය. අත්පුඩි ගසමින් මේ දෙසට එන්නැයි ඇඟවූවා ය. මෙම ක්‍රමවේදයන් අයත් වන්නේ ආවාචික සන්නිවේදනයේ දී,

(1) කාය භාෂාවට ය.
(2) රූප භාෂාවට ය.
(3) සංකේත භාවිතයට ය.
(4) පාරිසරික සාධකයකට ය.

25. කිසියම් නිශ්චිත අරමුණක් ඉටුකර ගැනීමට සංවිධානය වූ සංවිධානයක ප්‍රධානියාගේ අධිකාරී බලය යටතේ සැලසුම් සහගතව ක්‍රියාත්මක වන්නේ,

(1) අවිධිමත් සන්නිවේදනයේ දී ය.
(2) විධිමත් සන්නිවේදනයේ දී ය.
(3) සමූහ සන්නිවේදනයේ දී ය.
(4) අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ය.

26. රචනාවක් ලිවීම පිළිබඳව සිංහල විෂයය බාර ගුරුතුමිය අමන්දිට උපදෙස් දුන්නා ය. ඉතා පිළිවෙලින් පැහැදිලිව, විරාම ලක්ෂණ යොදමින් එය කළ යුතු බව අවධාරණ කළාය. එයට අදාළ වන නිර්ණායකය වන්නේ,

(1) ශ්‍රව්‍ය සන්නිවේදනයේ දී ලේඛන නිපුණතා වැදගත් වීමයි.
(2) සාහිත්‍යමය ලේඛනවල නිර්මාණශීලී බව යොදා ගැනීමයි.
(3) පුද්ගයකුගේ ලේඛනයක අධිකාරී බලය පවත්වා ගැනීමයි.
(4) වාචිකව යමක් ඉදිරිපත් කිරීමට වඩා ලේඛනය විධිමත් විය යුතු වීමයි.

27. මිලානේ ව්‍යාපාර සමාගමේ රියදුරු මහතකුට එරෙහිව එහි පාලකයාට ලැබුණු ලිපියක ඇතුළත් විස්තර කිසිවක් එම රියදුරු මහතාට නොදන්වා ඔහුගේ ගමන් බිමන් පිළිබඳව ප්‍රශ්න කිරීම සිදුවිය. මෙම අවස්ථාව හැඳින්විය හැක්කේ,

(1) අභිසාරී මාධ්‍යය ලෙසයි.
(2) ප්‍රදීපාගාර උපක්‍රමය ලෙසයි.
(3) දොරටුපාල සංකල්පය ලෙසයි.
(4) ප්‍රතිපෝෂණ ක්‍රියාවලිය ලෙසයි.

28. ශ්‍රමායික කැමරාවක සුවිශේෂී ලක්ෂණය වන්නේ,

(1) රූප තැන්පතු ගොනු ආකෘති සැකසීම යි.
(2) බැටරි භාවිත කිරීමක් අවශ්‍ය නොවීම යි.
(3) සෘණ සේයා පටල යොදා නොගැනීම යි.
(4) අදහස් ප්‍රබලව ඉදිරිපත් කර හැකිවීම යි.

29. පුවත්පතේ පිටුවේ ඉඩකඩ හා තොරතුරේ වැදගත්කම අනුව එහි පළවිය යුතු ප්‍රමාණය තීරණය කිරීම ප්‍රවෘත්තියට මාතෘකාවක් යෙදීම සිදු කරන්නේ,

(1) ප්‍රධාන කතෘ විසිනි.
(2) ප්‍රධාන උප කර්තෘ විසිනි.
(3) සංස්කාරක කතෘ විසිනි.
(4) නියෝජ්‍ය කර්තෘ විසිනි.

30. මාධ්‍ය වැඩසටහන් තෝරාගෙන පරිහරණය කිරීම හෙවත් රටේ සෑම පුරවැසියකුටම මාධ්‍ය නිසිලෙස පරිහරණය කිරීමට ඇති කුසලතාව යනු,

(1) රාජ්‍ය හිතකර බව යි.
(2) ආරක්ෂණ අධිකාරිය යි.
(3) මාධ්‍ය සාක්ෂරතාව යි.
(4) රාජ්‍ය සෘජු මැහැත්වීම යි.

31. ගුවන් විදුලි නාලිකාවක් සමඟ සැසඳීමේ දී රූපවාහිනී සේවාවක විශේෂතාවක් වන්නේ,
(1) ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් ඉදිරිපත් කිරීම.
(2) එක් එක් අංශ ප්‍රධානීන් තාක්ෂණය භාවිත කිරීම.
(3) වේශ නිරූපණය හා පසුතල නිර්මාණය සිදුවීම.
(4) තාක්ෂණික ශිල්පීන්ගේ සහය අවශ්‍ය වීම.

32. මානනය, අනාවරණය යන අවස්ථා දෙකෙහි දීම එකම කාචයක් භාවිත වීම, කැමරාවේ උපාංග අවශ්‍ය පරිදි හැසිරවීමට ඇති හැකියාව වැනි ලක්ෂණ ඇතුළත් වන්නේ,
(1) ප්‍රක්ෂේපණ කැමරාව (2) ස්වයංක්‍රීය කැමරාව
(3) ඒක කාච ප්‍රතිඡායා කැමරාව (4) නිශ්චල කැමරාව

33. ශ්‍රී ලංකාවේ පුවත්පත් ඉතිහාසය තුළ ආරම්භ කරන ලද ප්‍රථම පෞද්ගලික පුවත්පත් ව්‍යාපාරය ලෙස සැලකෙන්නේ,
(1) ලේක් හවුස් පුවත්පත් සමාගම යි. (2) විජය පුවත්පත් සමාගම යි.
(3) වීරකේසරී පුවත්පත් සමාගම යි. (4) එක්ස්ප්‍රස් නිව්ස් පේපර්ස් සමාගම යි.

34. යමක් අවධාරණය කරමින් හා විස්තර කරමින් නැවත නැවත අදහස් හුවමාරු කර ගැනීමට හැකිවීම විශේෂතාවක් වන්නේ,
(1) සමූහ සන්නිවේදනයෙනි. (2) මහජන සන්නිවේදනයෙනි.
(3) අන්තර් පුද්ගල සන්නිවේදනයෙනි. (4) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයෙනි.

35. ඡායාරූපයට හසුකර ගන්නා අරමුණ වඩාත් පැහැදිලි වන සේ කාචය සීරු මාරු කර ගැනීම හඳුන්වන්නේ,
(1) අනාවරණය. (2) මානනය. (3) කාච වර්ගය. (4) නාභිගත කිරීම.

36. A - මෙම යන්ත්‍රය සඳහා භාවිත කළ යුත්තේ, විනිවිදක රූප රාමු වේ.
B - යන්ත්‍රය තුළ ද අධි බලැති විදුලි බුබුලක් ඇත.
C - රූප රාමු මාරුකිරීම අතින් කළ හැකිය.
D - විනිවිද පෙනෙන පුවරුවක් හෙවත් කාචයක් ඇත.
ඉහත ප්‍රකාශ අතුරෙන් කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයට අදාළ වන්නේ,
(1) AB හා D පමණි. (2) BC හා D පමණි.
(3) AB හා C පමණි. (4) CD හා AB යන සියල්ලම ය.

37. ප්‍රවෘත්ති විශේෂාංග හා විවිධ විශේෂාංග වැඩසටහන් මගින් හා වෙනත් රසවින්දනාත්මක ආකෘතීන් තුළින් කළ නොහැකි වන්නේ,
(1) දේශීය වෙළඳපොල සංවර්ධනය කිරීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමයි.
(2) මිනිස් සමාජයේ සදාචාරාත්මක සංවර්ධනය සඳහා යොදාගැනීමයි.
(3) සංවර්ධනාත්මක චින්තනය පෝෂණය කරමින් ජනතාව දිරි ගැන්වීමයි.
(4) නිර්මාණාත්මක චින්තනය හා පරිකල්පනය විනාශ කර දමමින් සමාජය විනාශ කිරීමයි.

38. ලිපියක් ලැබීමෙන් පසු එම ලිපිය ලද බව සඳහන් කිරීමට කාර්යාලවල භාවිත වන කුඩා උපකරණය වන්නේ,
(1) නිල මුද්‍රා යන්ත්‍රය යි. (2) දින මුද්‍රා යන්ත්‍රය යි.
(3) ගණක යන්ත්‍රය යි. (4) මුදල් සටහන් යන්ත්‍රය යි.

39. 1925 දෙසැම්බර් 16 වෙනි දින ලංකාවේ ගුවන්විදුලිය රාජ්‍ය ආයතනයක් වශයෙන් විවෘත කරනු ලැබීය. එය
(1) ආසියාවේ ප්‍රථම ගුවන්විදුලිය යි. (2) සීමා සහිත එක්සත් ගුවන්විදුලි සේවය යි.
(3) රජයේ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව යි. (4) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංඥා සමාගම යි.

40. එක් ස්ථානයකින් ඇතුළු කරන යම් කඩදාසියක ඇති සටහන විද්‍යුත් තරංග බවට පත්කර පසුව එම තරංග ග්‍රාහක යන්ත්‍ර වෙත ගමන් කිරීම සිදු වන්නේ,
(1) දුරකථනය මගිනි. (2) මුද්‍රා යන්ත්‍රය මගිනි.
(3) ෆැක්ස් යන්ත්‍රය මගිනි. (4) පේජරය මගිනි.

(ල. 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

87 | S | II

10 ශ්‍රේණිය

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

කාලය පැය 02 යි
අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකය:

වැදගත් :

- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

01. ගිරාදුරුකෝට්ටේ ගොවි ජනපදයක අභිජනන බීජ වගාව පිළිබඳව සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කොට පැවැත්වුණි. ඒ සඳහා ප්‍රදේශයේ ගොවි මහතුන් සහ ගොවි සංවර්ධන නිලධාරීන් ද දේශකයන් ද සහභාගී විය.

(i) මෙම අවස්ථාවේ ක්‍රියාත්මක සන්නිවේදන අරමුණ සඳහන් කරන්න.

(ii) දේශනය පැවැත්වෙන අතරතුර දී ගොවි මහතුන් අතර භාවිත වූ අවාචික සන්නිවේදන විධික්‍රම දෙකක් ලියන්න.

(iii) මෙම සම්මන්ත්‍රණයේ දේශකයා සිය දේශනය සඳහා භාවිත කළ සන්නිවේදන උපකරණ දෙකක් නම් කරන්න.

(iv) මේ සම්මන්ත්‍රණ අවස්ථාවේ ගොවි සංවර්ධන නිලධාරී මහතකුට දුරකථන ඇමතුමක් ලැබුණි. දුරකථන භාවිතයේ දෙපාර්ශවයම පිළිපැදිය යුතු ආචාර ධර්ම දෙකක් සඳහන් කරන්න.

(v) ගොවි සංවර්ධන කටයුතු සඳහා වෙබ් අඩවියක් පවත්වා ගෙන යාමට තීරණය විය. වෙබ් අඩවියක් පවත්වා ගෙන යාමේ වාසි දෙකක් සඳහන් කරන්න.

(vi) නව අභිජනන බීජ වර්ග හා කෘෂි රසායන භාවිතය පිළිබඳ වූ පොත් පිංචක් ගොවීන් අතර බෙදාහරින ලදී. එය ලබාගත් පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ වාසි දෙකක් සඳහන් කරන්න.

(vii) මෙම වැඩසටහන පිළිබඳ ප්‍රතිචාර විමසා බැලීමට ප්‍රශ්නාවලියක් සෑම ගොවි මහතකුටම තැපෑලෙන් යැවීමට යෝජනා විය. මුද්දර භාවිත කිරීමේ දී ඒ සඳහා යොදා ගත හැකි ආරක්ෂාකාරීම යන්ත්‍රය කුමක් ද?

(viii) දේශකයන් විසින් ඉදිරිපත් කරන ලද වැදගත් කරුණු ගොවීන් විසින් සටහන් කර ගන්නා ලදී. ලිඛිත සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ix) මෙම වැඩසටහන අවිධිමත් සන්නිවේදන අවස්ථාවක් නොවන බව සඳහන් කළ හැකි සාධක දෙකක් නම් කරන්න.

(x) ගොවි මහතුන්ගේ අදහස වූයේ දේශන ඉතා සාර්ථකව පැවැත්වුණ බවයි. ඒ සඳහා දේශකයන් විසින් ඉවහල් කර ගන්නා ලදැයි සිතිය හැකි කරුණු 02 ක් ලියන්න.

02. සන්නිවේදන වර්ග බෙදීමේ පදනම වන්නේ සන්නිවේදනයේ යෙදෙන පුද්ගල සංඛ්‍යාවයි.

(i) ජන සන්නිවේදනයේ ක්‍රියාත්මක වීම මගින් අපේක්ෂිත මූලික අරමුණ කුමක් ද?

(ii) පරිගණක ආශ්‍රිත ප්‍රකාශන ක්‍රියාවලියේ අත්පිටපත සැකසීම සිදුවන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(iii) පන්ති කාමර මාධ්‍ය උපකරණ භාවිත කිරීමේ වාසි තුනක් සඳහන් කරන්න.

(iv) ජනමාධ්‍ය හිමිකමේ රාජ්‍ය දායකත්වය ගුවන්විදුලියට හා රූපවාහිනියට අදාළව විස්තර කරන්න.

03. සමාජයේ කුඩාම ඒකකය පවුලයි. එය මව හා පියා දරුවන් ද යන සාමාජිකයින්ගෙන් සමන්විතය.

(i) ජන වර්ගයක් යනු කුමක්දැයි අර්ථ දක්වන්න.

(ii) අවිධිමත් සන්නිවේදන දම දෙකක් විස්තර කරන්න.

(iii) නිශ්චල ඡායාරූපකරණයේ විශේෂතා තුනක් විස්තර කරන්න.

(iv) වාචික භාෂාවට වඩා ලිඛිත භාෂාව විධිමත් බව හෙලි කිරීමට අදාළ වන සාධක හතරක් විස්තර කරන්න.

04. කැමරාවෙන් ඡායාරූප ගැනීම ඉතා නිර්මාණශීලි කාර්යයයි. එහි දී බලපාන්නේ පුද්ගලයාගේ ඇස හා චින්තනය යි.

(i) ඡායාරූප ශිල්පියා විසින් කැමරාවේ සියලු කොටස් මෙහෙයවන යාන්ත්‍රික කැමරාව හඳුන්වන නම කුමක් ද?

(ii) වාචික සන්නිවේදන නිපුණතා සංවර්ධනයට ගතයුතු ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න.

(iii) අන්තර්පුද්ගල සන්නිවේදනය සඳහා යොදා ගැනෙන තාක්ෂණික මෙවලම් දෙකක් කෙටියෙන් හඳුන්වන්න.

(iv) සාම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍ය දෙකක් හා නූතන දෘශ්‍ය මාධ්‍ය දෙකක් කෙටියෙන් හඳුන්වන්න.

05. ජනමාධ්‍ය යනු රූපවාහිනිය, ගුවන්විදුලිය හා පුවත්පත වේ. මෙය සන්නිවේදන ක්‍රියාදාමය තුළ සුවිශේෂී තත්වයකි.

(i) ජනමාධ්‍යයට ඇති සමාජීය වගකීම, මාධ්‍ය ආයතනයේ අරමුණ පවත්නා සාමාජීය තත්වය ආදී විවිධ හේතූන් මත ක්‍රියාත්මක වන, සංදේශ පාලනය වන සංකල්පය කුමක් ද?

(ii) මානවයා විසින් කථන භාෂාවක් නිර්මාණය කර ගැනීම අක්ෂර නිර්මාණය කර ගැනීම සුවිශේෂී අංගයකි. මානවයා විසින් අක්ෂර නිර්මාණය කරගත් ආකාරය අනුව බිහි වූ අක්ෂර වර්ග දෙක හඳුන්වන්න.

(iii) අභිසාරී මාධ්‍ය හඳුන්වා උදාහරණ දෙකක් මඟින් විස්තර කරන්න.

(iv) පන්ති කාමර මධ්‍ය උපකරණ භාවිතයේ දී යොදා ගැනෙන ප්‍රක්ෂේපණය කළ හැකි මාධ්‍ය උපකරණ හා ප්‍රක්ෂේපණය කළ නොහැකි මාධ්‍ය උපකරණ දෙක බැගින් හඳුන්වන්න.

06. ශ්‍රී ලංකාවේ පුවත්පත් ඉතිහාසය තුළ මහජන සංවිධාන හා පෞද්ගලික ව්‍යාපාර විසිනුත් පුවත්පත් බිහිකර ඇත.

(i) 1961 දී සීමාසහිත ඇම්. ඩී.ගුණසේන සහ සමාගම විසින් ආරම්භ කරන ලද පුවත්පත් සමාගම කුමක් ද?

(ii) රටක සියලුම මාධ්‍යවේදීන් වර්ග කිරීමේ දී බෙදෙන කොටස් දෙක හඳුන්වන්න.

(iii) ජනමාධ්‍ය නියෝජන අධ්‍යයනය යටතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය විස්තර කරන්න.

(iv) ගුවන්විදුලි ආයතනයක දැන්වීම් අංශය හා රූපවාහිනියේ දැන්වීම අංශය අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

07. හැඟීම් සිතුවිලි හා අදහස් අන්‍යයන් සමඟ හුවමාරු කර ගැනීම සන්නිවේදනය යනුවෙන් අර්ථ දැක්විය හැකිය.

(i) [A] → සන්දේශය → මාධ්‍යය → [D] → බලපෑම මෙහි A හා D නම් කරන්න.

(ii) ඉහත නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ කිනම් වර්ෂයක ද? කවුරුන් විසින් ද?

(iii) ගුවන්විදුලි සේවා හිමිකම වර්ග කර දක්වන්න.

(iv) නිශ්චල ඡායාරූප භාවිතය නිසා මුද්‍රිත මාධ්‍යයට ලැබෙන වාසි හතරක් විස්තර කරන්න.

පිළිතුරු පත්‍රය - I කොටස

1 -(4)	2 -(3)	3 -(2)	4 -(3)	5 -(2)	6 -(1)	7 -(4)	8 -(4)	9 -(4)	10 -(3)
11-(1)	12 -(3)	13 -(3)	14 -(3)	15 -(1)	16 -(2)	17 -(4)	18 -(3)	19 -(4)	20 -(2)
21-(2)	22 -(1)	23 -(4)	24 -(1)	25 -(2)	26 -(4)	27 -(3)	28 -(2)	29 -(2)	30 -(3)
31-(3)	32 -(3)	33 -(1)	34 -(3)	35 -(4)	36 -(3)	37 -(4)	38 -(2)	39 -(1)	40 -(3)

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

II කොටස

01. (i) තොරතුරු සම්පාදනය / අධ්‍යාපනය ලබා දීම (උපදෙස් සම්පාදනය) / පෙළඹවීම.

(ii) ඉගිබිගි, ඉරියව් / ස්පර්ශය / අත් පය වැනීම් / ඇස්වල හැසිරීම / හඬ / නිහඬ බව.

(iii) මයික්‍රපෝනය / ශබ්ද විකාශන උපකරණ / ප්‍රක්ෂේපණ උපකරණ / පරිගණකය

(iv)
- ★ දුරකථය සක්‍රීය වූ විගසම තමන්ගේ අනන්‍යතාව හෙලි කිරීම.
- ★ දෙපාර්ශවයේම ගෞරවය රැකෙන පරිදි වචන භාවිතා කිරීම.
- ★ කිව යුතු දේ කෙටියෙන් කීම.
- ★ තමන්ට විමසිය යුතු දේ පිණිවිඩය ලබන්නාට පැහැදිලිව තේරුම් ගත හැකි අයුරින් ඉදිරිපත් කිරීම.
- ★ අවශ්‍යතාවට අනුව නිසි ලෙස සූදානම් වීම.
- ★ දුරකථනයෙන් විසඳිය නොහැකි ප්‍රශ්න සඳහා දුරකථනය යොදා නොගැනීම.
- ★ තමාට අනවශ්‍ය දුරකථන ඇමතුමක් නම් ආචාරශීලීව සම්බන්ධතාව විසන්ධි කිරීම.
- ★ තමා නොදන්නා අතහැරුණු ඇමතුම්වලට ඇමතීමෙන් වැළකීම.
- ★ තම නොදන්නා අයගේ කෙටි පණිවිඩවලට පිළිතුරු දීමෙන් වළකින්න.
- ★ පෙර ගෙවුම් සහිත දුරකථනයක් නම් සන්නිවේදන මධ්‍යස්ථානයකට තම අංකය ලබා නොදී කාඩ්පතක් මගින් පෙර ගෙවුම් කරන්න.
- ★ දුරකථනය තමන්ගේ පෞද්ගලික ජීවිතයට බාධාවක් කර නොගන්න.
- ★ දුරකථන භාවිතය යනු මුදල් බව අමතක නොකරන්න.

(v)
1. කාර්යාලයේ තොරතුරු වහාම ලෝකය පුරා ඕනෑම කෙනෙකුට ග්‍රහණය කරගත හැකිවීම.
2. කාර්යාලයේ තොරතුරු යාවත්කාලීන කිරීම.
3. කාර්යාලයේ කාර්යයන් සමාජයට විවෘත කිරීම.
4. කාර්යාලයේ කටයුතු වඩාත් විධිමත්ව හා පිළිවෙළකට කළ හැකි වීම.
5. කාර්යාලයේ තොරතුරු වේගවත්ව නිකුත් කළ හැකිවීම.
6. වෙබ් අඩවිය ඔස්සේ විවිධ ප්‍රතිචාර වහා ලබාගත හැකි වීම.

(vi) අඩු පිරිවැය / ආකර්ශනීය නිමාව / ඉක්මන් බව පහසුව / කාර්යක්ෂමතාව

(vii) තැපැල් මුද්‍රා යන්ත්‍රය

(viii) දැනුම සංරක්ෂණය කර තබා ගත හැකිවීම. / නැවත නැවත පරිහරණය කළ හැකි වීම.

(ix) නිශ්චිත මූලාශ්‍රයක් පැවතීම. / මූලාශ්‍රය හඳුනා ගත හැකි වීම. / නිශ්චිත ස්ථානයක්, දිනයක්, වේලාවක් තිබීම / තොරතුරු ගලායාමේ ක්‍රමවත් බවක් තිබීම. / සංවිධානාත්මක බවක් සහිත වීම.

(x) පෙර සූදානම / ආකර්ශනීය කථන විලාසය / තාක්ෂණික උපකරණ භාවිතය / කාලකළමණාකරණය / වගකීම හා වගවීම. / ග්‍රාහක කේන්ද්‍රීයව කතා කිරීම. / ආචාරශීලීත්වය / අවාචික සන්නිවේදන විධික්‍රම භාවිතය

02. (i) වාණිජ අරමුණ

(ii) තමන් නිම කරන්නට අපේක්ෂා කරන ප්‍රකාශනයේ හැඩරුව පිළිබඳව සිතේ තබාගෙන එයට උචිත ලෙස අත් පිටපත සැකසිය යුතුය. අත්පිටපතට අදාළව පිටු සැලසුම් කිරීමට අවශ්‍ය පිළිවෙළ අත් පිටපතේ නිරූපණය විය යුතුය.

(iii) ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යය පහසු කිරීම.
ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයෙහි ඵලදායීතාව ඉහළ නැංවීම
ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය වඩා උද්‍යෝගිමත් හා ආකර්ෂණීය කිරීම.
තොරතුරු ග්‍රහණය කර ගැනීමට, තේරුම් ගැනීමට, මතකයේ රඳවා ගැනීමට, ග්‍රාහකයන්ට පහසු වීම, ඉදිරිපත් කරනු ලබන තොරතුරුවලට අදාළව විවිධ මාධ්‍ය ස්වරූප මගින් පෙර සැලසුම් කරන ලද හා ඒ අවස්ථාවේදීම සැලසුම් කරන ලබන ඡායාරූප, රූප සටහන්, චලන දර්ශන ආදිය ඉදිරිපත් කළ හැකිවීම.
ඉගෙනුම් - ඉගැන්වීම් පරිසරය ප්‍රියජනක බවට පත්වීම.

(iv) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව / ලක්හඬ ගුවන්විදුලි සේවය
ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව / ස්වාධීන රූපවාහිනී සේවය.

03. (i) ජන වර්ගයක් යනු එකම භාෂාවක් හෝ එකම ආගමක් හෝ පිළිගත් පොදු සංස්කෘතියකින් එක්ව ජීවත්වන ජන සමූහයකි.

(ii) 1. තනි දාමය
මෙහි දී එක් අයකුට ලැබෙන තොරතුරු තවත් අයෙකුට ලැබේ. එතැනින් තවත් කෙනෙකුට ලැබේ. මෙසේ එක් එක් පුද්ගලයාගෙන් පිළිවෙලට ආරංචිය පැතිර යාම සිදු වේ.

2. ඕපාදූප දාමය
එක් අයකුගෙන් බොහෝ දෙනාට වශයෙන් තොරතුරු පැතිරේ. එහි දී අසන්නන් තෝරා ගන්නේ පිළිවෙලකටය.

3. සම්භාවිතා දාමය
සන්දේශය නිදහසේ පුද්ගලයාගෙන් පුද්ගලයාට ගලා නොයයි. සන්දේශය ආරම්භ වන ස්ථානයෙන් එය ලබා දෙන්නේ කාටදැයි කිව නොහැක. එහෙත් ලබා දෙන්නේ එක් අයකු විසිනි. සන්දේශය පැතිර යන්නේ තෝරා ගත් අය මගිනි. එම නිසා සියලු දෙනාටම සන්දේශය නොලැබේ.

4. ආරම්භකයා විසින් තමා තෝරාගත් කිහිප දෙනෙකුට සන්දේශය ලබා දෙයි. ඔවුන් විසින් ද එම සන්දේශය ලබා දෙන්නේ තෝරාගත් කිහිප දෙනෙකුට පමණි.

(iii) ★ ගත වී යන කාලයෙන් එක් මොහොතක් නවතා ගැනීමට නිශ්චල ඡායාරූපයකට හැකියාව ඇත.
★ යමක් ඇසින් දැකගැනීමට හැකිවීම නිසා ග්‍රාහකයා තුළ වැඩි විශ්වාසයක් ජනිත කළ හැකිය.
★ වචනයෙන් විස්තර කළ නොහැකි දේ ඡායාරූපයකින් ඉදිරිපත් කළ හැකිය.

(iv) එහි ව්‍යාකරණ තිබේ. / අක්ෂර වින්‍යාසය තිබේ. / අකුරුවල හැඩයක් තිබේ. / විරාම ලක්ෂණ යෙදිය යුතුය. / ලිවීමේ දී වචන ඈත්කර ලිවිය යුතුය. / එක් වාක්‍යයකින් තවත් වාක්‍යයක් වෙන් කර දැක්විය යුතුය. එක් ඡේදයක් තවත් ඡේදයකින් වෙන්කර දැක්විය යුතුය.

04. (i) ශ්‍රමායික කැමරාව

(ii) ★ තමා සතු තොරතුරු - අදහස් ප්‍රමාණය පුළුල් කර ගැනීම.
★ කථන රටා පුහුණු වීම. / කථනය සඳහා පෙර සූදානම
★ අන්‍යයන්ගේ කථා හා අංගචලනය හා ඉරියව් අධ්‍යයනය සවන් දීමට පුහුණු වීම.
★ කථනය සමඟ අංගචලනය හා ඉරියව් භාවිතය පුහුණුව.

(iii) තැපැල් ලිපි / ෆැක්ස් පණිවුඩ / දුරකථන (ජංගම, ස්ථාවර) / විද්‍යුත් තැපෑල / අන්තර්ජාල දුරකථනය / සමාජ ජාල නව මාධ්‍ය

(iv)

සාම්ප්‍රදායික දෘශ්‍ය මාධ්‍ය	නූතන දෘශ්‍ය මාධ්‍ය
ගින්දර, දුම	අත් පත්‍රිකා
ගස්වල එල්ලූ කොළ අතු	පෝස්ටර්
චිත්‍ර	පොත් පිංච / ධාරා සටහන්
ගස්වල කැපූ කට්ටා	බිත්ති සටහන් / මාර්ග සංඥා

05. (i) දොරටුපාල සංකල්පය

(ii) පරිසරයේ විවිධ රූප නිර්මාණාත්මක ලෙස යොදා ගනිමින් අක්ෂර නිර්මාණය කර ගැනීම සිදුවිය. මේවා හඳුන්වන්නේ රූපාක්ෂර හෝ චිත්‍රාක්ෂර යනුවෙනි. මේ එක් අක්ෂරයකින් හඬක් වෙනුවට අදහසක් ඉදිරිපත් කිරීම සිදු වේ.

චීන / කොරියානු / ජපන් → රූපාක්ෂර
සංකේතාත්මක අක්ෂර
යම් අක්ෂරයක් එම ජනයා විසින් පිළිගනු ලැබීම නිසා එයට කිසියම් උච්චාරණය කළ හැකි හඬක් ඇතිවීමය. අකුරුවලට උච්චාරණය කළ හැකි හඬක් ලැබී ඇත්තේ එය භාවිත කරන්නන් විසින් එය පිළිගනු ලැබීම නිසා පමණි. ලොව පුරා විවිධ ජන කණ්ඩායම් තමන්ගේ කථන භාෂාව සඳහා සංකේතාත්මක භාවිත කරමින් එය ලේඛන භාෂාවක් බවට පත්කර ගන්නා ලදී.

(iii) අන්තර්ජලය භාවිතයට ගනිමින් සියලු මාධ්‍ය එක් රැස් වීම මාධ්‍ය අභිසාරීතාව වේ. අන්තර්ජලය මඟින් පුවත්පත් කියවන්නන් ගුවන්විදුලියට සවන් දෙන්නට, රූපවාහිනිය නරඹන්නට, සිනමාපට නරඹන්නට හැකිය.

(iv)

ප්‍රක්ෂේපණය කළ නොහැකි මාධ්‍ය උපකරණ.	ප්‍රක්ෂේපණය කළ හැකි මාධ්‍ය උපකරණ.
★ කළු ලෑල්ල.	★ ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය.
★ සුදු ලෑල්ල.	★ කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රය.
★ කාන්දම් ලෑල්ල.	★ ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය.
★ පත්‍රිකා ලෑල්ල.	★ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය.
★ පිටු පෙරළනය	★ අන්තර් ක්‍රියාකාරී පුවරුව.

06. (i) දවස පුවත්පත් සමාගම හෙවත් ස්වාධීන පුවත්පත් සමාගම

(ii) ආයතනයකට සම්බන්ධ මාධ්‍යවේදීන් / නිදහස් මාධ්‍යවේදීන්

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iii) ස්ත්‍රී පුරුෂ භාවය යනු ජීව විද්‍යාත්මක සංකල්පයකි. එනම් ස්ත්‍රිය හා පුරුෂයා ජීව විද්‍යාත්මකව වෙනස් බවය. එහෙත් සමාජය තුළ දී හා සමාජීය කාර්යයන් වන රැකියාව, දේශපාලනය, ආර්ථික කටයුතු, ආගමික කටයුතු, සංස්කෘතික කටයුතු ආදියේ දී ස්ත්‍රිය හා පුරුෂයා සමානව සැලකෙන බව ස්ත්‍රී- පුරුෂ සමාජ භාවය වේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු සමාජ විද්‍යාත්මක සංකල්පයකි. සාම්ප්‍රදායික සමාජය තුළ ස්ත්‍රියට හා පුරුෂයාට වෙන් වන්ව කාර්යයන් පවරා දී තිබුණි. නූතන සමාජය තුළ එහි ස්වරූපයන් වෙනස් වී තිබේ. සාම්ප්‍රදායිකව තිබූ සමාජ තත්වයන්ගේ සහ කාර්යභාරයන්ගේ සංකීරණ තත්වයන් අද ගොඩ නැගී තිබේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාය දියුණු සමාජයකට උචිත සංකල්පයකි. මෙය සමාජගත කිරීම ජනමාධ්‍යයේ වගකීමයි. කෘෂිකාර්මික සංස්කෘතියක් තුළ යම් යම් සීමාවන් දකින්නට ලැබුණත් එහි දී ද සාම්ප්‍රදායක අනර්ථකාරී ආකල්පයන්ගෙන් මිදී කටයුතු කරන්නට අවශ්‍ය මග පෙන්වීම ජනමාධ්‍ය මගින් ස්ත්‍රියට හා පුරුෂයාට ලබා දිය යුතුය.

(iv) ගුවන්විදුලි ආයතනයක දැන්වීම් අංශය

ගුවන්විදුලි කාලය අලෙවි කරනු ලබන්නේ මේ අංශයෙනි. ගුවන්විදුලි සේවාවට ආදායම ලැබෙන්නේ මේ මගිනිත මේ නිසා අද වන විට සෘජු දැන්වීම් මෙන් ම අනුග්‍රාහක දැන්වීම් ද ගුවන්විදුලි මධ්‍යය තුළ බහුලව යොදා ගැනේ. ප්‍රවෘත්ති විකාශනය වන කාල සීමාව දැන්වීම් අලවිය සඳහා බහුලවම යොදා ගැනේ.

රූපවාහිනී ආයතනයක දැන්වීම් අංශය

ගුවන්විදුලි සේවාවකට වඩා රූපවාහිනී සේවාවක වියදම් අධිකය. ඒ නිසා රූපවාහිනී විකාශන කාලය ආදාම් බවට පත්කර ගැනීමට සිදු වේ. ඒ අනුව සෘජු වෙළඳ දැන්වීම් සඳහා මුදල් ලබා ගැනීමත් වැඩසටහන් විකාශනය සඳහා අනුග්‍රාහකයින් ලබා ගැනීමත් යන කාර්යයන් දෙකම සිදු වේ. ජනප්‍රිය වේලාවන්හී දී රූපවාහිනී දැන්වීම් මිල ඉතා ඉහළය.

07. (i) A - සන්නිවේදකයා D - ග්‍රාහකයා

(ii) 1948

මහාචාර්ය හැරල්ඩ්. ඩී. ලැස්වෙල්

(iii)
- ★ රාජ්‍ය හිමිකම් සහිත ගුවන්විදුලි සේවා
- ★ මහජන සංවිධාන හිමිකම සහිත ගුවන්විදුලි සේවා.
- ★ පෞද්ගලික ව්‍යාපාර හිමිකම සහිත ගුවන්විදුලි සේවා

(iv)
- ★ අදහස් ප්‍රබලව ඉදිරිපත් කිරීමට ඇති හැකියාව.
- ★ තාත්වික බව නිසා ග්‍රාහක විශ්වාසනීයත්වය දිනා ගැනීමට හැකිවීම.
- ★ පහසුවෙන් ග්‍රාහක ආකර්ෂණය ලබා ගැනීමට හැකිවීම.
- ★ පහසුවෙන් මුද්‍රණ තාක්ෂණය හා අනුගත වීමට හැකියාව.
- ★ ඕනෑම අයෙකුට පහසුවෙන් තේරුම් ගැනීමට ඇති හැකියාව.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank